## ආරක්ෂක අමාත්‍යාංශය

## කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

## කාලගුණ විද්‍යා සහායක III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින කාලගුණ විද්‍යා සහායක III ශ්‍රේණියේ තනතුරු පිරවීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. තනතුරේ ස්වභාවය ;

I. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. තවද වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට අදාළ අරමුදල සඳහා දායක මුදල් ගෙවිය යුතුය. බඳවා ගනු ලබන්නේ කාලගුණ විද්‍යා සහායක III ශ්‍රේණියේ තනතුරටය.

II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.40000-10x450-10x490-10x540-12x590-61880/- (PL – 1 - 2025 ) වේ. (රා.ප.ච 10/2025 හී උපලේඛන III හි විධිවිධාන අනුව ගෙවීම් සිදු කරනු ලැබේ.) බඳවා ගනු ලබන දින සිට වසර 03 ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය. (පත්වීමේ දින සිට වසර තුනක (03) යටත් වන අතර සුදුසුකම් සම්පූර්ණ කල පසු තනතුරේ ස්ථිර කරනු ලැබේ.)

III. පැවරෙන රාජකාරි ;

(අ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රය පිරිසිදු කිරීම, කාර්යාල භූමිය පිරිසිදු කිරීම හා නඩත්තු කටයුතු වලට සහාය වීම, කාලගුණ විද්‍යා නිරීක්ෂණ කටයුතු සිදු කරන උපකරණ කොටුව පිරිසිදු කිරීම සහ නියමිත ප්‍රමිතීන්ට අනුව පවත්වාගෙන යාම.

(ආ) කාලගුණ විද්‍යා උපකරණ පිරිසිදු කිරීම් කටයුතු , නඩත්තු කිරීම් වලට සහාය වීම. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලයන්හි කාලගුණ විද්‍යා නිරීක්ෂණ කටයුතු වලට සහාය වීම.

(ඇ) රාත්‍රී කාලයේ ප්‍රාදේශීය කාර්යාල වල උපකරණ ආරක්ෂා කිරීම සඳහා කටයුතු කිරීම

IV. සේවා මුර ක්‍රමයට රාජකාරියේ යොදවනු ලබන අතර රාත්‍රී සේවා මුරයන් වලද රාජකාරි ඉටු කළ යුතු වේ.

03. සුදුසුකම් ;

මූලික සුදුසුකම් ;

I. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.
II. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන **2026.07.20** දිනට වයස අවුරුදු **18** ට නොඅඩු සහ අවුරුදු **45** ට නොවැඩි විය යුතුය. (රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක නියුතු මේ වන විට සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

IV. අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදි යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයන් හැර)

කායික සුදුසුකම් ;

V. සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. බඳවාගැනීමෙන් පසු පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයේ දී සේවය සඳහා සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවය නොමැති බව තහවුරු වුවහොත් තනතුරට නුසුදුසු සේ සලකා සේවයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

VI. තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් **2026.07.20** දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

04. මෙයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත් **2026.07.20** දින ප.ව **4.15** ට **පෙර** ලැබෙන සේ කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, අංක 383, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් පමණක්** එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " **කාලගුණ විද්‍යා සහායකයින් බඳවාගැනීම සඳහා අයදුම්පත්** " යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් කවර හේතුවක් නිසා හෝ ක්‍රියා නොකරනු ලබන අතර, දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත තම ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය.

05. භාෂා ප්‍රවීණතාවය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. අදාළ මට්ටමේ දෙවන භාෂා ප්‍රවීණතාවය ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් නතර කරනු ඇත.

06. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛණ වල පැහැදිලි ඡායා පිටපතක් ස්වකීය අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. (මුල් පිටපත් නොවේ.)

I. උප්පැන්න සහතිකයේ පිටපතක්
II. ජාතික හැඳුනුම්පතේ පිටපතක්
III. අධ්‍යාපන සුදුසුකම් සහ පුහුණුව (ලබා තිබේ නම්) සනාථ කිරීම සඳහා වූ සහතික වල පිටපත්
IV. සේවා පළපුරුද්ද සම්බන්ධව සහතික වල (තිබේ නම් පමණක්) පිටපත්
V. ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචි හා චරිතය පිළිබඳ සහතිකය (මාස 06 ක් තුළ ලබාගත්)
VI. මෑතකදි ලබා ගත් චරිත සහතික දෙකක්

07. සම්මුඛ පරීක්ෂණයකට කැඳවූ අවස්ථාවේ හා පත්වීම් බලධාරියා ඉල්ලීම් කරන ඕනෑම අවස්ථාවක සහතිකපත් වල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට සූදානමින් සිටිය යුතුය.

08. මෙම නිවේදනයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

09. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

සටහන ;

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

ඒ.එල්.කේ. විජේමාන්නගේ

කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් (ආවරණ)

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

කොළඹ - 07

2026.06.15